# හත්පණ

www.sinhalaelibrary.com

# 1. උපන් පණ

නෙරළුවේ කුසල් හාමි ගමරාල හොඳ පොහොසතෙකි. ගොඩින් අමුණු පහක්ද , මඩින් අමුණු හතක්ද පමණ වූ ඉඩම් ඔහුට ඇත . ඔහුගේ මහ පෙට්ටියේ යට තට්ටුව අත ගා බලන්නට ලැබුණොත් ඔහුට මුදලුත් ඇද්ද නැද්ද යනු හොඳින් දැනගත හැකිය .

සකසුරුවම් කමින් කුසල් හාමිනෝ හිමියාට කිසි සේත් දෙවනි නොවේ . පෙට්ටියේ මුදල් රැකෙතියි ඇයගේ විශ්වාසයක් නැත. එක එක ලිග්ගල ලඟ වළලන ලද මහ කැටයක් පමණ මුදල් රකින්නට හොඳ දෙයක් නැති බව ඕ දනී . ඇය විසින් මුදල් රැක්ක යුත්තේ හිමියාගෙන් පමණකි. ඊට මෙතරම් හොඳ ක්‍රමයක් තවත් නැත.

මේ දෙමහල්ලනට පුතෙක්ද, දුවක්ද වූහ. දුව රූමත් තරුණියකි. ඇයගේ කෙස් වැටිය විහිදා ලූ කල කණට වැටේ. ඇඟ තැඹිලි පාටය. උදයම මැද්දාට පසු නම් දත් සුදුය. හවස් වන විට ඒ රතට හැරෙයි. හොඳ උස මහතින් යුත් මේ තරුණිය දෙමව්පියන්ට මහත් ආඩම්බරයකි.

පුතාගේ නම කිරි හාමිය . හේ උස්ය, මහත්ය, කදිම පෙනුමක් ඇත්තෙකි. ළමා කල අකුරු කරන්නට යයි අසල පල්ලියට යැවූ නමුත් ඔහු දන්නා අකුරක් නැත. ඔහු ගේ නුවණ කොතරම් දැයි කියත හොත් කවුරුත් ඔහුට 'පණ්ඩිතයා' යයි කියති. කිසි දෙයක් ගැන කල්පනාවක් කිරීම නුවුවමනා බැවින් මේ නම හොඳට සුදුසු යැයි මව්පියෝද කියත්.

ගම පුතාට තවත් නමෙක් වෙයි . එනම් 'කිරි බත් හාමි ' යනුයි. වැදමක් වූ දා හෝ, මඟුලක් වූ දා හෝ බොහෝ දෙනා රැස්ව සිටිද්දීම, කිරිබත් ගොඩක් සොයා ගන්නට බැරි වෙන ලෙස හංගන ගුරුකමක් කිරිහාමි දනී . එසේ කරන්නේ අනුනට ඉඩක් නොදීම පණ්ඩිත කම් දොඩමින්ය. 'කිරි හාමි' යන්නට 'බත්' යන ටික නිකන්ම එකතු වුණා නොවන බව මෙයින් පෙනේ.

නිඳන්නට ගිය විට කිරි හාමි රෑ දවල් වෙනසක් නොදනී. 'මේ කටයුතුය, මේ නොකට යුතුය' යන්නක් කිරි හාමි කිසි විටෙකත් නොදකී . එබඳු යමක් අනෙකෙකු කිවද ඔහුට නොඇසේ. ඔහුට හිතුනොත් සියල්ලම නොකටයුතුය. මේ නිසා කිරිහාමිට ඇති තවත් නම් බොහෝය.

කොපමණ නම් ඇති වුවත් කිරිහාමිගේ හොඳ ගුණයෙක් වෙයි . එනම් නම්බු නමක් වුවත් අවනම්බු නමක් වුවත් එක ලෙස සැලකීමයි. මේ නිසා කිරිහාමිගේ හිතට කිසි පීඩාවෙක් නැත . එහෙයින් ලෙඩ දුක් ඔහු නොදන්නා දෙයෙකි.

ලෙඩක් දුකක් නැති හෙයින් කිරි හාමි කන බොන දෑ හොඳට අල්ලයි. ඉතින් ඇඟ මහත් වීම පුදුමයෙකැ ? එනෙක් අයට කෙසේ කල දවස ගියත් කිරි හාමි සුවසේම ජීවත් වීම පුදුමයෙකැ ?

www.sinhalalibrary.com

# 2. මැරෙණ දවස

ගම දුවගේ මගුල් දිනය පැමිණියේය. ගම ගෙදර ඉදිරියෙහි මහත් තොරණකි. ගෙය වියන් බැඳ සියළු ඇඳ පුටු සුදු අතුරා අලංකාර කරන ලද්දේය. නෑදෑයෝ වටින් පිටින් එන්නට වූහ.

ඒ කිරිහාමිට බොහොම හොඳ දවසෙකි. 'අනේ අම්මේ, ඉතින් ආයෙත් මෙහෙම දවසක් ලඟදී ඒදැ' යි කිරිහාමි නොයෙක් වර ඇසීය. 'ඇයි ඔබට හිර ගෙනෙන දා' යනු මවගේ පිළිතුරය.

කිරිහාමි වරක් කැවුම් තුබූ තැනට ගොස් ඉන් හත අටෙක රස බලයි. වරක් කිරිබත් කැටි කරන තැනට ගොස් ඉන් කැටි හත අටෙකට ඉඩ ගෙන දෙයි. 'කිරිබතේ ලුණු කිරි රස ඇද්ද, පුතේ ?' යි මව අසයි. අනේ, මා දන්නේ නෑ අම්මේ. ගුණ දොස් කිය කියා වැඩේ පාළු කරන්නට ආවා නොවෙයි මා' යි කියමින් කිරි හාමි තමාගේ කටයුත්තම කෙරෙයි.

දැන් ගෙය නෑදෑයන්ගෙන් පිරුණේය. බත් වේලාවද ලඟය. 'පුතේ, අනේ, හොඳ පුතා වගේ මේ අමුඩයත් කලයත් අරගෙන අර වෙලේ ලිඳට ගොහින් නාලා එන්න. අද මේ මඟුල් දවසේ හොඳට පිරිසිදු වී ඇඳගෙන ඉන්නට එපා යැ' යි මව කීවාය. වෙන දා මෙවන් කීමක් නොසැලකුවත් කැවුම් කිරිබතේ අනුහසින් කිරිහාමි කීකරු විය.

වෙලේ ලිඳ ලඟ කඹයක් නොවීය. කිරි හාමිට දිය ලණුවෙක්ද නොවීය. ඉතින් කෙසේ අමුඩ ගසන්නටද ? කෙසේ ලිඳෙන් දිය අදින්නටද ? වෙලේ ලිඳ ලඟම දිග එළි කැර සිටිනා ගොනා දැක කිරි හාමි කඹය කණුවේ බැඳ කොන ලිහා ගත්තේය. අනෙක් කොන ගොනා ගේ කරේමය. කිරිහාමි කඹයේ මැද ඉණේ දවටාගෙන අමුඩය

www.sinhalalibrary.com

ගසාගත්තේ ය. කොන කලයේ බැඳ දිය ඇද ඇද නාන්නට විය.

මේ අතර ඒ අසලින් ගිය සඟ නමක් ඒ දැක 'මහ මෝඩයෙක් ! ගොනා කඹය ඇද්දොත් ?' යි කීයේය. ඒ 'කඹය ඇද්දොත් ! එහෙනම් මා අද්දන්නෙ' යි කියමින් කිරිහාමි නැවේය. 'කඹය ඇද්දොත් -

බිම පෙරළෙයි<br>
කළය බිඳෙයි<br>
ගොනා දිවෙයි<br>
වැඩ ගොඩ වෙයි

යනු කියමින් සඟ නම ගියේය.

වරක් කිරිහාමි දිය කළය හිසට ඔසවනු හා සමඟම කඹයේ තදය දැනී ගොනා හිස ගැස්සීය. එයින් පය ලිස්සා ගොස් කිරිහාමි ළිං පඩිය උඩ වැටී කළය මහ හඬින් කුඩු විය. ගොනා බිය ගෙන කිරිහාමිද ඇදගෙන දුවන්නට වන්නේය. ඒ නියරෙහි මේ නියරෙහි හැපීමෙන් කිරි හාමිට බොහෝ තුවාල විය. වේදනාව ඉවසා ගත නොහී හේ මර හඬ දෙන්නට විය. එහෙත් ගොනා නොනැවතීම දිව්වේය.

කිරිහාමිගේ මර හඬ ඇසී ගෙදර මිනිස්සු වහා දිව අවුත් කඹය කපා ඔහු ගලවා ගත්තෝය. නිදහස් වූ වහාම කිරි හාමි සඟ නම සොයා දුවන්නට වන්නේය. 'පුදුම හාමුදුරු කෙනෙක් ! මා වැටෙන බව, කළය බිඳෙන බව, ගොනා දුවන බව කලින්ම කී හැටි' යි සිතමින් හේ පසු නොබලා දිව්වේය.

සඟ නම දුටු තැනදී කිරිහාමි වැඳ වැටුනේය. අනේ හාමුදුරුවනේ, අර මා වැටෙන බව, කළය බිඳෙන බව,

www.sinhalelibrary.com

ගොනා දුවන බව කලින්ම දැක්කේ දිවැසින්ද ?

'ඔව්'

'අනේ, එහෙනම් මා මැරෙන දවසත් කියන්න'

'හිසත් පයත් එක තරමට සීතල වුණු දා'

මෙසේ කියා සඟ නම ගියේය. මැරෙන දවස දැන ගතිමියි කියමින් කිරිහාමි ගෙදර ආයේය. ගෙදර කලබලය එයින් නැවතී මඟුලේ කටයුතු හොඳින් කැරුණේය.

# 3. පළමු වන මරණය

දිනක් කිරි හාමි කජු පුහුලම් කැමට යාළුවන් සමඟ ගඟ ළඟ කජු ගහට ගියේය. කවුරුත් අත පොවන තැන්වල වූ පුහුලම් කඩා කන්නට වූහ. ගහට නැමුණු අත්තෙක අග ලොකු පුහුලමක් දැක, කිරි හාමිට එයම කන්නට අශාවෙක් විය.

'යන්නට එපා, යන්නට එපා. අත්තත් කඩාගෙන වැටෙයි' යනු යහළුවෝ කීහ. කිරි හාමි එය නොඅසා අතු අගටම ගියේය. 'ජරාස්' යන අනුකරණයෙන් අත්ත කැඩී කිරි හාමිත් සමඟම ගඟට වැටුනේය. කිරි හාමි හොඳටම තෙමුණු නමුත්, යන්තම් පණ බේරාගෙන ගොඩට ආයේය.

සීතලක් දැනුණෙන්, එදා සඟ නම කී වචන සිහි වී කිරි හාමි වහා හිසත් පයත් අතගා බැලීය. දෙපළම එකසේ සීතල ය. 'මා මළා, මා මළා' යි මහ හඬ නගමින් හේ බික පෙරළුණේය. යහළුවෝ වහා ළංව ඔහු ඔසවන්නට උත්සාහ කලෝය. 'මා මළා, මා මළා' යි කියමින් කිරි හාමි බිමටම වැටුණේය.

'කිරි හාමි, ඔබට පිස්සුද ? නැඟිටිනවා, නැඟිටිනවා.'

'මා මළා. නැඟිටින්නේ කෙසේද ?'

'මළා මළා නම් දොඩන්නේ ?'

'මල අය දොඩන්නේ නැද්ද ? එදා අපේ ගෙදර මඟුල් දවසේ හාමුදුරුවන් කීවා, ''හිසත් පයත් එක සැටි සීතල වුණු දා මළා තමයි'' කියා.'

'අනේ, කිරි හාමි, පිස්සු නැතිව නැඟිටිනවා. යමු ගෙදර.'

'මා මළා. ගෙදර යන්නේ කෙසේද ? හාමුදුරුවන් දිවැසින් දැකලා කීවේ.

පුළුවන්නම් මගේ මළ කඳ ගෙදර ගොහොන් දමනවා.'

යහළුවෝ කිරි හාමි උස්සාගෙන ගෙදර ගොස් සියළු සිද්ධිය කීවෝය. කිරිහාමිගේ මවුපියෝ ඔහු නැඟිටුවන්නට නොයෙක් උත්සාහ කලහ. එහෙත් හේ නොනැඟියේ මය. 'හාමුදුරුවන් හට වඩා දන්නා කෙනෙක් නෑ. හාමුදුරුවන් දිවැසින් දැක කී දේ වරදින්නට පුළුවන් ද ?' යි කියමින් 'මා මළා. ඉතින් මා වළ ලන්නේ නැද්දැ'යි හඬ දෙන්නට වීය.

'අනේ, කිරිහාමි පිස්සු නැතිව නැඟිටින්න. මේ බත් කන්න මේ කිරි බොන්න යි කිය කියා මවුපියෝ කන්නළවු කළහ. කිරි හාමි ඒ කිසිවකට ඇහුම්කන් නොදී මා වළ ලන්නේ නැද්ද ? මා මළාට හඬන්නේ නැද්ද ?' යනාදිය කියමින් මර හඬලන්නට ම වීය. අවට නෑදෑයන් අවුත් කිරිහාමි නැඟිටුවන්නට කළ වෑයමින් ද කිසි පලෙක් නුවූයේය.

අන්තිමේ දී කිසිවන් කැර-ගත නොහී කිහිප දෙනෙක් කිරිහාමි ඔසවාගෙන සොහොනට ගොස් පස් ගොඩ දෙකක් අතරේ හොවා ආවෝය. කිරි හාමි එයින් සැනසී සැබවින්ම මලාක් මෙන් ඇස් දෙක පියාගත්තේය. දැත් එක්කොට බඩට දුන්නේය. දෙපය ලං කලේය. ඇඟ කෙලින් තබා නිසොල්මන් වූයේය.

# 4. දෙවන පණ

එදා රෑ පල් සොරු මුළක් ගෙයක් බිඳ, බඩු ගෙන සොහොන මැදින් යෙති. සමහරු බඩු මිටි හිසින් ගෙන යෙති. සමහරු මුදල් පසුම්බි අදිය එල්ලා ගෙන යෙත්. මෙසේ යන එකෙක් සොහොනෙහි හොත් කිරි හාමි පයින් මැඩ ගෙන ගියේය.

නිඳා උන් කිරි හාමි පිබිද සොරුන් දැක 'අනේ, මුන් ගේ නොහැදුණු කම ! මළ එකෙකුට වත් නිකම් ඉන්නට අරින්නේ නෑ නොවෙයැ' යි කීයේය. සොරු ඒ අසා නැවතී, ඒ කවරෙක්දැයි බැලූහ. එකෙක් 'මේ කවුදැ' යි ඇසීය.

'ඒ මම, කිරි හාමි. මා මළා. ඉතින් මළ එකා පාගාගෙන යෑම හරිද ?'

සොරුනට සිනා නොසී සිටීම අමාරු විය. 'මැරුණේ හැබෑවටමද ? බොරුවටදැ' යි අනෙකෙක් ඇසීය.

'මෙන්න මුට පිස්සු. බොරුවටත් මැරීමෙක් ඇද්ද ? බල හාමුදුරුවන් කීවා හිසත් පයත් එක සැටි සීතල වුණු දා මළාය කියා. ඊයේ මා ගඟට වැටී හිසත් පයත් එක සැටි සීතල වුණා. ඉතින් මා මළේ නැද්ද ?'

'මේ කුමණ පිස්සෙක්ද ? බිල්ලකට බොහොම අගෙයි. බොරු නැතිව එනවා යන්නට' යි සොර දෙටුවා කීය.

'අනේ, මා මළා, මා මළා. මළ එකාට ඉන්නට දී යනවා යන දිසාවෙක' යි කිරි හාමි අඬන්නට වූයේය. හොර මුළේ හිටි එකෙක් දෙන්නෙක් ද හොරට අඬන්නට වූහ.

'අනේ ඉතින් කවදා දකින්නට දැ' යි එකෙක් ඇඬීය. 'අනේ මාත් ඉඳලා කුමටදැ' යි තවකෙක් ඇඬීය. කිරි හාමි කිපී 'තොපි යන අතෙක යවු. මළ එකාට කවටකම් කැර අපායට විතරක් යන්නට එපා' යි ගෙරෙව්වේය.

එක් සොරෙක් ඉදිරියට පැන 'හා හා, කවටකම් කරන්න එපා. හොඳයැ ? මොහු ඇත්තෙන්ම මැරිලා. මා දන්නවා හොඳ මන්ත්‍රයක් ගිය පණ ගෙන්වන. කැමති නම් මතුරා බලන්නට පුළුවනි. හැබැයි පණ එනවා නම් දකුණු පයේ මහපට ඇඟිල්ලේ වේදනාවක් දැනෙයි. මතුරා බලන්නටද ?' යි කීයේය. කිරිහාමිද මීට කැමති විය.

හොරාද පිහියෙන් කිරිහාමිගේ පයේ මහපට ඇඟිල්ලට අනින ලෙස අනෙකකුට කියා මතුරන්නට විය. 'ඕං නමො ගිය පණ වරෙන්, ගිය පණ වරෙන්, ගිය පණ වරෙන්, ගිය පණ වරෙන්, ස්වාහා' යි මතුරනු සමඟම කිරිහාමිගේ දකුණු පයේ මහපට ඇඟිල්ලේ වේදනාවෙක් විය. 'පණ ආවා, පණ ආවා' යි මහ හඬ නඟමින් හේ නැගිටියේය. ඉක්බිති පණ දුන් සොරා වැලඳ ගෙන ඔහුට පින්දී, ' අනේ, ඔබ නිසා මා ආයෙත් මේ ලෝකයට ආවා. ඔබට දිව සැපත් ලැබේවා' යි කියමින් කඳුලු වගුරුවමින් හඬන්නට වීය.

'ඉතින් කොහිද යන්නේ' යි සොර දෙටුවා ඇසීය. 'වෙන කොහි යන්නටද ? මා ගෙදර යනවා. ඔබට පින් සිදු වුණාවේ' යනු කිරි හාමි කීය. 'හා, හා, වරක් මැරී ගෙදරටම යන්නට හොඳ නෑ. අප එක්ක යමු' යි පණ දුන් සොරා පැවසීය. 'අනේ කියන තැනකට එනවා, නරකාදියට වුනත් එනවා, එනවාමයි. මගේ පණ ඔබ නොවේදැ' යි

කියමින් කිරි හාමි යළිත් අඬන්නට වූයේ ය.

# 5.දෙවන මරණය

සොර මුල දුනක් කිරිහාමිත් ගෙන ගෙයක් බිඳින්නට ගියෝය. සොරු ගෙයි සන්ධි බලා බිඳිති. කිරිහාමි ඔවුනට බැණ වදී. 'තොව වගේ නපුරු අය තවත් ලෝකේ ඇද්ද ? අනේ කොතරම් වියදම් කොට කොතරම් අමාරුවෙන් තනාපු ගෙයක්ද ? බිඳිනවා නම් ගෙදර මිනිසුන්ගෙන් අසා බින්දාම නරකද ?'

කිරිහාමි නවතාගත නොහී සොරෙක් අතෙහි වූ යකඩ උළ ඔසවා 'කට වසාගෙන නොසිටියොත් මෙයින් ඇණ මෙතැනම මරමි' යි තරවටු කළේය. 'තොපට හොඳ නම් බිඳිවු. මේ පව් කොට මට නරකාදි යන්නට බෑ' යි කිරිහාමි ඒ ගෙදර කුස්සියට වැදුණේය.

කිරිහාමිට එදා බොහෝම බඩගිනි විය. එහෙයින් දුම අතගා බැලීය. එහි මුං ඇට ටිකක් තිබී ඔහුට අසු විය. ඒ එය ගෙන ඇතිලියෙක ලා ලිප තබා පිම්බේය. එයින් අලු යටව තිබුණු ගිනි අඟුරු මතු වීය. ලිප වටා තිබුණු සිහින් දර කැබලි හා කොළපු කැබැල්ලක් ද එක්කොට නැවතත් පිම්බේය. එයින් ගිණි ඇවුළුණේය.

කිරිහාමි මුං ඇට ටික බදින්නට වන්නේය. ලිප ළඟම ඉතා නාකි ගෑණියක් උඩට කට ඇරගෙන නිදයි. කිරිහාමි බැදෙන මුං ඇට ටිකක් පොල් කටු හැන්දෙන් ගෙන 'අනේ ආතේ, මේ මුං ඇට බැදුණා ඇද්දැයි බලන්නැ' යි කියමින් ඒ ගෑණියගේ ලොඹු කටේ ලීය. අසරණ මැහැල්ල මර හඬ දෙමින් නැඟිට දිවුවාය. ගෙදර මිනිස්සු පිබිද අවුත් කිරිහාමි අල්ලා ගසෙක බැඳ අතින් පයින් පහර දෙන්නට වන්හ.

'අනේ මා මරන්නට එපා. එක වරක් මැරී ආයෙත් යන්තම් පණ ගත්තේ' යි කිරිහාමි කන්නළවු කරන්නට වීය. 'තා මෙහි සොරකමට ආවා දැ' යි මිනිස්සු ඔහුට තමන්ගේ අතපයේ සවියම දක්වති. 'මා හොර කමට ආවේ නෑ. සොරුන් සමඟ තමා ආවේ. උන් ගෙය බිඳින කල මා උනට කීවා "ගේ බිඳින්නට එපා" ය කියා. බිඳිතත් ගෙදර මිනිසුන්ගෙන් අසා බිඳින්නට කීවා. උන් ඇහුවේ නෑ. ඉතින් මා කුස්සියට ගොස් බඩගින්නට මුං ඇට ටිකක් බැද, බැදුණා ඇද්දැයි බලන්නට මේ ආතාගේ කටේ ටිකක් දැමුවා. ආතාට මුං ඇට සියල්ලම නුදුන්නාට දෝ මරහඩ ලැවා 'යි කිරිහාමි සියළු තොරතුරු කීයේය.

ගෙදර මිනිස්සු ඔහුගේ කතාව අසා සිනාසී, ඔහු ගෙදරම නවතා ගත්තෝය. හෙද ගෙදර ඉතා කීකරුව වැඩ පළ කළේය.

දිනක් පණම් අටක් දී වලං ගෙනෙන්නට කිරිහාමි යවන ලදී. කිරිහාමි කඩයට ගොස් වලන් ඉල්වීය. කඩකාරයා වලං ගොඩක් පෙන්වා 'එකක් තුට්ටු දහය ' යි කීවේය. කිරිහාමි කිපුණේය.'මා නුපුරුදු නිසා රවටන්නට සිතුවාද ? මේ වලඳ තූටු දහයක් ! හැබෑවටම මෙය තුට්ටු දහයක් දී ගන්නා අයත් ඇද්ද ? කැමති නම් මෙය පණම් අටකට දෙනවා. මා ළඟ ඇත්තෙත් එපමණයි' කිරිහාමි මෙසේ කී කල 'එහෙ නම් ඇරගෙන යනවා. ඉතින් එපමණ කියන ලද කල නොදී පුළුවන්දැ' යි කියා කඩකාරයා පණම් අට ගෙන වලඳ දුන්නේය.

කිරිහාමි වලඳත් ගෙන ගෙදර එන අතර මහ වැස්සෙක් ආයේය. එයින් හේ හොඳටම තෙමුණේය. ඇඟ සීතල විය. ගේ මිදුලට එනවිට මැරෙන දවස මතක් වී, වහා හිසත් පයත් අතගා බැලීය. දෙපළම එක සැටි සීතලය. 'මා මළා, මා මළා' යි හඬ නඟමින් කිරි හාමි එතැනම පෙරළුණේය. වලඳ කුඩුව ගියේය. ගෙදර මිනිස්සු වහා දිව ආහ.

'නැඟිටින් කිරිහාමි, නැඟිටින්' යි මිනිස්සු කීවෝය. 'අනේ මා මළා. හාමුදුරුවන් දිවැසින් බලා කීවේ හිසත් පයත් එක සැටි සීතල වුණුදා මා මැරෙන බව. අනේ ඉතින් මා කුණු වන්නට නැර ගෙන ගොස් වල ලන්න' යි කියමින් කිරි හාමි කෙඳිරි ගෑවේය. ඇස් පියා ගත්තේය, කට තද කැර ගත්තේය, දැතද, දෙපයද එක් කලේය. මලාක් මෙන් හොත්තේය.

ගෙදර මිනිස්සු බියට පැමිණියෝය. 'මේ මරණයට අප අසු වුණොත් ගැලැවෙන්නේ කෙසේදැ' යි ඔහු සිතූහ. 'මේ බව එලිවන්නට කලින් මොහු කැලෑවට ගෙන ගොස් දමමු' යි එකෙක් කීය. සියල්ලෝ එයට කැමති වූහ. එහෙයින් සතර දෙනෙක් කිරිහාමි ඔසවාගෙන ගොස් කැලෑවෙහි ලා ආවෝය.

www.sinhalaelibrary.com

# 6. තුන් වන පණ

එඬේරෙක් හරක් රළ දක්කා ගෙන කැලෑව මැදින් යන්නට ආයේය. ඒ රැළෙහි මහ මී ගොන්නුද, අං දිග මී ගොන්නුද, වූහ. පැටවු ඔවුන් සමඟ දිව ආහ.

මළ කිරිහාමි හරක් රළ දක්කේය. හරකුන්ගේ කුරෙහි මහතද, අඟෙහි දිගද ඔහුට හොඳ හැටි පෙනුණේය. හරක් රළ ලං වන විට කිරිහාමිට තමා මළ බව මතක නොවීය. වහා නැඟිට දිව ගොස් හේ එඬේරාට බැණ වදින්නට විය. 'පව්කාරයා, හරකුන් දක්කන්නේ මළවුන් ගේ ඇඟ උඩින්ද ? මෙහෙම පව් කළාම යන්නේ කොයි ලෝකෙද ?'

එඬේරා පුදුම විය

'මළ කා ගේ ඇඟ උඩින්ද මා හරකුන් දැක්කුවේ ?'

'මගේ ඇඟ උඩින්'

එඬේරාට මහ සිනාවක් පහළ විය.

'හා, හා, මේ කතා කරන්නේ මැරිලා !'

'ඔව්, හිසත් පයත් එක සැටි සීතල වුණු දා

මැරෙන බව දිවැස් ඇති අපේ හාමුදුරුවන් කීවා. අද වැස්සට තෙමී මගේ හිසත් පයත් එක සැටි සීතල වුණා. මා මළා.'

එඬේරාට මේ මරණය හොඳින් වැටහුණේය. 'ඉතින් ඒ ගිය පණ ගෙන්නීමට ගුරු කමක් කළේ නැද්ද ?'

'අනේ නෑ'

'පණ ගෙන්නා ගන්නටද කැමැත්ත ?'

'අනේ, ඔව්. අනේ, ඔව්. ඔබ ගුරු කමක් දන්නවා නම් කරන්න. පණ තිබෙන තාක් මා ඔබට මෙහෙ කරනවා.'

'හා, ඒ ගුරු කම අමාරු එකක් නොවෙයි. මගේ හරකුන් එහෙම ඉඳ හිටලා මැරෙනවා. එවිට මා උන්ගේ පණ ගෙන්වන්නේ මෙයින්.' මෙසේ කියා එඬේරා තම අතෙහි තිබූ කෙවිට පෑයේය.

කිරිහාමි ගුරු කම කරවා ගන්නට කැමති වීය. එඬේරා කිරි හාමි මුණින් බිම හොවා, කෙවිට ඔසවා මෙසේ කීයේය. 'හැබැයි පණ එන විට ටිකක් රිදෙයි. ඊට බයක් ගන්නට එපා. හොඳටම පණ ආවාම මට කියන්නට ඕනෑ' මෙසේ කියා එඬේරා හැකි තරම් වැරින් පහර හත අටක් දුන්නේය. කිරිහාමි මුලදී ඇඟ අඹරවමින් වේදනාව ඉවසා ගත්තේය. කෙළවර ඉවැසිලි නැතිව, 'පණ ආවා, පණ ආවා' යි මහ හඬ නඟමින් නැඟිට දුවන්නට වීය.

'ඒක තමා මා කීවේ' යි එඬේරා ගසක් මුල

හොඳ ගෙන හති අරින්නට වූයේය. වේදනාව මදක් අඩු වූ පසු කිරිහාමි එඩේරා ලඟට අවුත් වැඳ වැටී 'අනේ, ඔබට පින් සිදු වේවා. යන්තම් ඒ වාරෙත් ගිය පණ ආවා. පණ ඇති තාක් මෙහෙ කරන්නට එන්නෙමි' යි කීය. 'හා, ඒක කෙසේ කරන්නට බැරිදැ' යි කියා, එඩේරා කිරි හාමිගේ සිත සැනැසුවේය. හේ අන්තිමයේදී 'ඉතින් යමු අපි ගෙදර' යි කියා කිරිහාමිද කැඳවාගෙන ගියේය.

එඩේර බිරින්දෑ කිරිආමි දැක ඔහුගේ පිට පුරා සිටි ලේ දැක හිසේ අත තබාගෙන 'අනේ මේ කුමක් වුනාද ? මේ කවුදැ' යි ඇසූ දෑය. 'හා හා, බයක් ගන්නට එපා. මේ ලමයා කැලෑව මැද්දේ මැරී උන්නා. මා ඉතින් ගුරුකමක් කැරලා බොහොම අමාරුයෙන් යන්තම් ගිය පණ ගෙන්නුවා. ඒ ගුරු කමට මෙහෙම වෙනවා. ඉතින් මේ ටික වෙලාවත් ගිය පණ ආවා නරකද ? ' එඩේරා මෙසේ කී කල බිරින්දෑ නොයෙක් ප්‍රශ්න අසන්නට වූ දෑය. 'මැරුණේ කෙසේද ? කළ ගුරුකම කිමෙක්ද ?' යන මේ ආදී ප්‍රශ්න වලට උත්තර දෙමින් කිරි හාමි තමාගේ සම්පූර්ණ ජීවිත කතාව කීයේය.

කථාව ඇසූ එඩේර බිරින්දෑට හිනායෙන් නම් ඉඩෙක් නැත. එහෙත් උන්දෑ ගෙයින් තෙල් ගෙන අවිත් කිරි හාමිගේ පිටේ ගා, ඔහුට කන බොන දෑ දුන් දෑය. කිරි හාමි ඒ ගැන නොකැමැත්තෙක් නොදක්වා ගෙයි පිළ උඩට වී හොඳටම නිදා ගත්තේය.

www.sinhalalibrary.com

# 7. තුන් වන මරණය

එඬේරාගේ අටමස් දරුවෙක් වූයේය. බොහෝ විට මේ දරුවා බලාගන්නේ කිරිහාමිය. මේ නිසා ඔහුට එඬේර බිරින්දෑ ගෙන් ලැබුණු සැලකිලි ඉතා මහත්ය.

දිනක් එඬේර බිරින්දෑ දරුවා නැවූ දෑ ය. නාවා ඉවර වූ පසුද දිය කොරහේ කෙලින්නට දරුවා ඉතා කැමතිය. එහෙයින් කිරිහාමිට දරුවා ගන්නට කියා එඬේර බිරින්දෑ තමාගේ කටයුත්තකට ගියදෑ ය. කිරිහාමි කීප වරක්ම දරුවා ගන්නට තැත් කලේය. එහෙත් දරුවා ඊට ඉඩ නොදෙයි. ඒ බව කී කල 'එහෙනම් කොරහේ දිය හලන්නැ' යි කියා, එඬේර බිරින්දෑ දියට ගිය දෑය.

කිරිහාමි දරුවා ඉන්දදීම කොරහ ඔසවාගෙන ගෙයි පිටිපසට ගියේය. ගෙදර කෙල්ල ඒ දැක, 'කුමක් ද මේ කරන්නට යන්නේ ?' යි ඇසුවාය.

'මේ කොරහේ දිය හලන්නට යනවා.'

'දරුවාත් එක්කද ?'

'නිකම් ඉන්නවා, පණ්ඩිත කම් නො දොඩා.'

මෙසේ කියා කිරි හාමි සිටගෙනම කොරහ

නැමීය. දරුවා පෙරළී බිම වැටී මහ හඬින් අඬන්නට වීය. කෙල්ල දිව ඇවිත් දරුවා වඩා ගෙන, කිරිහාමිට බැණ බැණ ගියාය.

'කුමක් වුණාද, මගේ පුතා අඬන්නේ ?' යි දිය කළයත් ගෙන එමින් සිටි මව ඇසුවාය. කෙල්ල කිරි හාමි කළ හපන්කම කීවාය. කොනකට වී බිම ඉරි අඳිමින් සිටි කිරිහාමි තමාගේ අතේ වරදක් නැති බව කියන්නට වූයේය.

'මට කොරහේ දිය හලන්නට කීවා නොවෙයැ ?'

'ඔව්. ඉතින් ළමයා හලන්නට මා කීවා යැ ?'

'නෑ, මා ළමයා හැලුවේ නෑ. දිය පමණයි, මා හැලුවේ. ඉතින්, ළමයා ගේ පොඩිකමට කළ දේ බලන්න.'

'කුමක් කළාද ?'

'කොරහෙන් වැටුණා.'

මවගේ කෝපය හොඳටම ඇවිස්සුණේය. දරුවාද මවගේ මුහුණ බල බලා තවමත් හඬයි. මවගේ හිණෙහි වූ දිය කළය සැණෙකින් කිරිහාමිගේ හිසට පැන, සියක් කැබැලිව බිම වැටුණේය. කළයේ දියෙන් කිරිහාමි සම්පූර්ණයෙන් නැවුණේය. මව දරුවා වඩා-ගෙන සිඹ සනසා, ඇඟ පිසිමින් ගියාය.

බුලත් විටක් කන වේලා යනවිට කිරිහාමිට සීතලෙක් දැනුණේය. සඟ නම කී මැරෙන දවස ඔහුට වහා මතක් විය. හිසද පයද අතගා බැලීය. දෙපළම එක සැටි සීතලය. 'මා මළා, මා මළා' යන මරහඬ ඇසී ගෙදර සිටි අය වහා දිව ආවෝය. ඔවුනට පෙනුණේ, ඇස්පියා, දැත් බඩමතට දී, දෙපා එක්කොට ගෙන, උඩ බලා බිම හොත් කිරිහාමිය.

එඩේරා එදා ගෙදර නැත. කිරිහාමිගේ තොරතුරු දන්නා නමුත්, දුන් පහර නිසා එඩේර බිරින්දෑට භයෙක් උපන්නේය. එහෙයින් අසල ගෙදර සිටි ගෑනුන් දෙන්නාද කැඳවා ගෙන ඉතා අමාරුවෙන් කිරිහාමි ඔසවාගෙන ගොස් කැලෑවේ දමා ආ දෑය.

www.sinhalaelibrary.com

# 8. හතරවන පණ

එදා කිරිහාමි ගේ ඇඟ කොළ අතුවලින් වසන ලදී. මරණය ගැන කිසි සැකයක් නැති කිරිහාමි එයින් වී හිරිහැරයද නොසලකා, මළ බවට වරදක් නොවන ලෙස ම හොත්තේය.

ඉනි කපන්නට කැලෑවට ගිය ගොවියෙක් ඒ අසලට පැමිණියේය. හේ කැපූ ඉනි දහ-පහළොහක් ඔසවාගෙන ගොස් කොළ අතු උඩ දැමීය. මළ කිරිහාමිට මේ නම් ඉවසිය නොහැක්කකි. එහෙයින් හේ ඉනි දෙපසට දමාගෙන නැඟිට සිටියේය. ගොවියා මහත් භයට පැමිණ බඹ ගණනක් දිව ගොස් පස්ස බැලීය. කිරි හාමි සිටි තැනම බණින්නට වන්නේය.

'හැබෑවට ම මේ මළ කඳට කරන සැලැකිල්ලද ? මෙපමණ තැන් තිබියදී ඉනි මළ කඳන් උඩ දමන්නට ඕනෑද ? මෙහෙම පච්කාරයන් ඉන්නා රටේ ඉන්නවාට වඩා මැරෙනවාම යි හොඳ.' කිරිහාමි මෙසේ කියා ගොවියා දෙස රවා බැලුවේය.

ගොවියා බියසුල්ලෙක් නොවේ. එහෙත් මේ නම් ඔහු කිසි කලෙක නොදුටු අවතාරයකි. එහෙයින් මදක් කලබල විය. මොහොතකින් ඒ කලබල ගතිය නැති කොට, අඩි කීපයක් ඉදිරියට තබා, කෝ මළ කඳ යි ඇසීය. 'කෝ මළ කඳ !' කෝපයෙන් දෙවරක් ඇද ඇද කියා, 'මේ මළ කඳ' යි තමා ම දැක්වීය.

'යස මළ කඳ ! සිටින දොඩන මළ කඳ ! ඇත්තෙන්ම මේ මැරිලාද ?

'ඇත්තෙන්ම මැරිලා. මා මැරුණු බව මට වඩා හොඳින් දැනෙන්නේ කාටද ? හාමුදුරුවන් දිවැසින් බලා කී දේත් වරදින්නට පුළුවන්ද ?'

ගොවියා මඳින් මඳ ළං වූයේය. මොලොකින් දොඩා කිරිහාමි ගේ කථාව සම්පූර්ණයෙන් අසා ගත්තේය. කොක් හඬලා සිනාසී මෙසේද කීය.

'ඔව්, මැරිලාමයි. මළ අයට පණ දෙන ගුරුකමක් මා දන්නවා. කැමති නම් කරන්නට පුළුවනි.'

'අනේ, පින් කඳේ, පුළුවන් දෙයක් කැරලා මට පණ දෙන්න. මා අතේ මිල මුදලෙක් නෑ, කියන දෙයක් කැර දෙන්නම්.'

'හා, හොඳා, ඒක බැරියැ ! මෙසේ කියා ගොවියා කිරිහාමිගේ අතගෙන ගියේය.

ගොවියා කිරිහාමි කඩි ගුලක් ලඟට ගෙන ගොස් කඩු ගුලට පිටුපා එය ඇවිස්සීය. කඩින් කිපුණු පසු මෙසේ කීය. 'ගිය පණ ඇදීමට ලෙහෙසි නොවේ. ටිකක් ඉවසා ගන්නට ඕනෑ.' ඉක්බිති කිරිහාමිට කඩි ගුල මත හිඳ ගන්නට නියම කළේය. කිරිහාමි ද පණට ආශාව නිසා මහත් භක්තියෙන් හිඳ ගත්තේය.

හුස්මෙක දී කඩි කිරිහාමිගේ ඇඟ පුරා දුවමින් දශ්ට කරන්නට වූ හ. ඒ වේලාවේදී කිරිහාමිගේ මූණ බලන්නට ම හොඳය. වරක් කට එක් අතකට යයි; වරක් අනෙක් අතට යයි; වරක් උල්

වෙයි; වරක් ඇරෙයි; වරක් කන්දෙක දක්වා පළල් වෙයි; නාසය ඇකිළෙයි; නළල රැළි වැටෙයි; කටට තදින් සුළං ඇදෙයි. කුමක් කළත් අන්තිමයේදී ඉවැසිලි නැතිව, 'පණු ආවා, පණු ආවා' යි මුළු රටටම ඇසෙන සේ කියා, කිරිහාමි උඩ පැන්නේය; හිස දෙපැත්තට ගසන්නටත්, ඇඟ අඹරවන්නටත්, දැතින් ම පස්ස කසන්නටත් පටන් ගත්තේය.

ඉවසාගෙන ඉන්නට පුළුවන් වූ පසු කිරි හාමි මීට පළමු මෙන්ම පින්දීම කොට ගොවියා සමඟ ගියේය. ගොවි ගෙදරදී ලැබුණු සැලකිල්ලෙන් මළ සැටිත් පණු ආ සැටිත් නොමතක වීය.

# 9. හතර වන මරණය

ගොවියා පැලට යන කල කිරි හම්ද යයි.මීට ගොවියාගෙද නොකැමැත්තෙක් නැත. කිරිහමි ඉන්නා තැන සිනායෙන් නම් අඩුවක් නැති හෙයිනි.

දිනක් එළි වන යමයේ දි ගොවියා ගේ කුඹුරට හරක් පන්නෝ ය. කිරිහමි දිග රිටක් ගෙන උන් එළවා ගියේ ය. පහරක් දෙන්නට පළමු හරක් කඩුල්ලෙන්ම පැන ගියෝ ය. රිටි පහරක් දෙන්නට බැරිවීම කිරිහාමිගේ හිතට පහරෙකි. එහෙයින් හේ කඩුල්ල උඩ හිඳ රෙද්දෙන් අමුඩය ගසා ගත්තේ ය. රිටද ගෙන හරකුන් පස්සේ යන්නට නැඟුණේ ය.

කොපමණ උත්සාහ කළත් කිරි හාමිට අඩියක් වත් ඉදිරියට යා නොහැකි ය. තමාට යන්නට නොදී යම් කිසිවෙකු තමා අල්ලා සිටින බව කිරි හාමිට දැනුණේය. අසල කුඹුරේ ගොවියාගේ පුතා සඳුන් හාමි, කිරිහාමි ගේ යාලුවෙකි. ඔහු කවට කමට තමාගේඅමුඩය අල්ලා ගන්නට ඇතැ යි කිරිහාමිට සිතුණේය . 'අනේ, සඳුනා, ඉතින් හරිනවා, අර හරකුනට එකක් දීල එන්නට.' එසේ ද කිරි හාමිට යනු නොහැකිය. 'මේ වැඩි කවට කම් හොඳ නෑ. කවටකමටත් වෙලාවක් ඇති නො වෙ යැ ? හරිනවා, හරිනවා.' කෙසේ කීවත් කිරි හාමිගේ අමුඩය හරින සැටියෙක් නැත.

'ඉතින් යාලුකම් නැති වන්නට යි. අත හරිනවාද නැද්ද?' මෙසේ කියා රිටද උස්සා කිරි හාමි ඇඹරී බැලුවේය. එහෙත් සඳුන් හාමි නම් එහි නැත. 'තමා අල්ලා ඉන්නේ කවරෙක් දැ' යි දැන ගත නොහැකිව කිරි හාමි ගොවියාට ඇසෙන සේ හඬ නැඟුවේ ය. 'මේ

www.sinhalalibrary.com

කුමන කෝලමෙක් ද්? මට යන්නට දෙන්නේ නැද්ද? ගොවියා මේ හඬ අසා දිව ආවේය. 'කුමක් වුණා ද, කිරි හාමි, කුමක් වුණා ද ?

'අනේ මේ බලන්න, මා අල්ලා-ගෙන ඉන්නවා.'

'කවුද, කවුද ?'

'මා දන්නෙ නෑ. බලන්න.'

ගොවියා කඩුල්ලට ළංවී බැලීය. ඔහුට කාරණය වැටහි, බඩ අල්ලාගෙන සිනා නො සි සිටිය නොහැකි විය .මා අල්ලාගෙන ඉන්ද දී ඔබට හිනා යි කිරිහාමි නොසතුටින් කීය. හා හා කිරිහාමි තරහ වන්නට එපා. මු ඉන්නා හැටියටයි මට හිනා ආවෙ. මූට දෙන්නම් එකක් ගොවියා මෙසේ කියා කඩුල්ලට පහරක් ගසා කඩුල්ල සොලවා කඩුලු ලීයද අස් කොට කිරිහාමි ගස්ඩගත් අමුඩය ගැලැවුයේය.එයින් කිරිහාමිට නිදහස ලැබිනි.

කඩුල්ල සෙලවීමේදි පිණි රාශියක් කිරිහාමිගෙ ඇඟ පුරා වැටුනේය. මහත් සීතලයක් දැනිනි. එවිටම කිරිහාමිට සඟ නම කී මැරෙන දවස සිහිවිය.සැනෙකින් ඔහුගෙ අත හිසට ගියේය. එතන සීතලය.ඉක්බිති අත පයට ගියේය.එතනද එමෙන්ම සීතලය. මා මළා මා මළා යි අහස දෙදරවමින් කිරිහාමි බිම වැටුනේය. අත අතට එකතු විය.පය පය එකතු විය. ඇස් පියවිනා. කට තද විය.

කිරිහාමිගෙ පරණ තොරතුරු දන්නා ගොවියා සිදු වුයේ කිමෙක්ද දැයි හොදින් දනී. එහෙත් හේ 'කිරිහාමිට ඉගෙන ගන්නට හරිමි යි සිතා ඔහු ඒ අසල කැලෑවට ඇද දැම්මේය. 'පණ

අවොත් කිරිහාමි ගෙදර දුරයැ ?' කියමින් ගොවියා කුඹුරට ගියේය.

www.sinhalaelibrary.com

# 10. පස්වන පණ

එදා ගොවියා ලෙඩ විය. ගොවි ගෙදර අය වෙද ගෙදර යෑමෙහිද, බෙහෙත් සැපයීමෙහිද, සාත්තු කිරීමෙහිද යෙදුණාහුය. කිරිහාමි ගැන මතක් කරන්නට වත් එකෙක් බොසිටියේය. එහෙයින් කිරිහාමි එදා රෑ කැලෑව මැදය.

සොර මුළක් මහ ගෙයක් බිඳ මුදල් ද වටිනා බඩු ද ගෙන කිරිහාමි හොත් තැනින් යෙති. අඳුරේ යන එක සොරෙකුගේ පයට කිරිහාමිගේ බෙල්ලම අසුවී ය. මඳ වේලාවක් හුස්මද නැතිව සිට, දොඩන්නට පුළුවන් වූ වහාම කිසිහාමි පුරුදු බැණීම පටන් ගත්තේය.

'කොතැන ගැලැවී ඉන්නටද ? පණ තිබුණත් ගැලැවිල්ලක් නෑ. මැරුණත් ගැලැවිල්ලක් නෑ. නපුරුම මිනිසුනුත් යන්නේ මළ මිනියට ඇතින්. මුන් යන්නේ මිනිය පාගාගෙන. යක්කු, යක්කු. මිනිස්සු යැ?'

සොරු එක් වරම දුවන්නට ඉගිළුණෝය. සොර දෙටුවා ඔවුන් නවතා කන්දී සිටියේය. තවත් දෙඩීමක් නොඇසුණු බැවින් සොරු 'දෙඩුවේ කවරෙක්දැ' යි බැලීමට ළං වූවෝය. එක් සොරෙක් කිරිහාමි දැක, මුහුණට එබුණේය. 'ඇයි ? ආයෙත් පාගාගෙන යන්නටදැ' යි කිරිහාමි ඇසීය. 'නෑ, යාළුවා, මේ කව්ද කියා බලන්නට' යි සොරා කීයේය. එවිට සොරු සියල්ලෝම කිරිහාමි වට කැර ගත්තෝය.

'මන්ද, මේ කැලෑව මැද නිදා-ගන්නෙ' යි

සොර දෙටුවා ඇසී ය. 'නිදා ගන්නේ ! කවුද නිදා ගන්නේ ?' මල කඳත් නිදා ගන්නා මිනිහාත් අඳුනන්නට බැරිද ? හිසත් පයත් සීතල වී මා මළා. ගෙදර මිනිසුන් මා මේ කැලෑවට ඇද දැමුවා.

'හ හ හ හ හා ! අනේ, මැරි-ලා. කටේ විතරයි යන්තම් පණ තිබෙන්නේ.'

'කටෙත් නෑ, මෝඩයා, පණ. මා හොඳට ම මළා. බෙල්ල පාගාගෙන ගියාම මළ කඳක් වුණත් කට පියාගෙන ඉඳී යැ ?'

සොරු සිනා හිරිකැර-ගත්හ. 'යමු, යාළුවා, විහිළු නැතිව' යි සොර දෙටුවා කී ය. 'මළ මිනිහා යන්නේ කෙසේද? කරදර නො කැර අනේ යනවා යන්නට' යි කිරි හාමි කෙදිරි ගෑවේ ය. 'ගිය පණ ගන්නට මට පුළුවනෑ' යි එක් සොරෙක් කී ය. 'අනේ, එහෙනම් තවත් ජීවත් වන්නට වාසනාව තිබෙන්නා වාගෙයි. හොඳයි, පණ ගන්න. මට දෙන්නට දෙයක් නෑ. ගෙදර වැඩපළ වත් කැර දෙන්නෙමි යි කිරි හාමි දුක්මුසු හඬින් පැවැසුවේ ය.

ඒ සොරා ගේ අතේ ඉතා සැර දුම් කුඩක් තිබුණේ ය. හේ එයින් විසි වරකට පමණ සෑහෙන දුම්කුඩු ගෙන කිරිහාමි ගේ නාසා පුට දෙක පුරවා තදින් පිම්බේ ය. කිරිහාමිට සියලු දෙව්ලොව පෙනී ගියේය. ඇසින් කඳුලු නික්මුණේ ය.හේ සොරා ද පෙරළා-ගෙන නැඟිට, 'පණ ආවා' යි හඬ නැඟීය. එක් සොරෙක් වහා ඔහුගේ කට තදකර අල්ලා ගත්තේ ය. කිරිහාමි තදින් ඒ මේ අතට ඇඹරුණ නමුත් සොරා අත බුරුල් නොකෙළේ ය. අන්තිමයේ දී කිරි හාමි ඇඟින් ඩදිය වගුරුවමින් බිම වැටුණේ ය.

'කෙසේ ද, යාලුවා ? පණ ආව දැ' යි

සොරා ඇසීය. 'පණ නම් ආවා. වෙනදා වගේ නො වෙයි. අද නම් පණ ආවේ බොහොම අමාරුවෙන්. කමක් නෑ. අමාරුවෙන් ආවත් පණ නොවෙයැ ? හා, යමු යන්නට. අද පටන් මැරෙන තුරු මගෙන් ඕනෑ වැඩක් ගන්නවා.' මෙසේ කියා නැඟිට කිරිහාමි පිටත් විය.

සොරු කිරිහාමි ද සමඟ සැක නැති තැනකට ගොස් බඩු ද, මුදල් ද බෙදා ගත්තෝය. කිරිහාමිට ද සුළු කොටසක් දුන්හ. එහෙත් කිරිහාමි කිසිවක් නො ගත්තේය. 'මට බඩුත් එපා, මට මුදලුත් එපා. මගෙන් පුළුවන් වැඩක් ගන්න. මට කරන උපකාරය නම් මා මළදා මට කරදර නො කැර, මා සමඟ වාද නොකැර සොහොනට ඇද දැමීම පමණයි.' සොරු එසේ කරන ලෙස ගිවිසියෝය.

# 11. පස් වන මරණය

දිනක් ඒ සොරමුළ කිරිහාමි ද සමඟ ගොස් ගෙයක් බින්දෝය. ඒ ගෙදර පිරිමි කීප දෙනෙක් වෙති. බොහෝ දරුණු ආයුධ ද ඇත. එහෙයින් මින් පෙර කිසි කලෙක සොරු ඒ ගෙය බිඳින්නට තැත් නොකළහ. කිරිහාමි ඇතුළට යවන අදහසින් මේ වර බින්දෝය.

සොරු කිරිහාමිට ද නොහැඟෙන ලෙස බිත්තියේ මහ සිදුරක් කොට, ඔහු ගෙට ඇතුළු කළහ. 'ඔසවන්නට බැරි පුළුවන් සොයල්ල අපට ගෙනැවිත් දෙන්නැ' යි ද කීහ.

පළමු කොට කිරිහාමි එසැවිය හැකි සියළු දේ ගෙන දුන්නේය. පසුව ගෙයි මුල්ලක මහ පෙට්ටියක් තිබෙනු දැක එය ඔසවන්නට උත්සාහ කළේය. එය නම් තනිව එසැවිය හැක්කෙක් නොවේ.

කිරිහාමි වටපිට බැලුවේය. පෙට්ටිය ළඟම එයට ඉසලා නිදා උන් හැඩි දැඩි මිනිහකු දැක ඔහුගේ උරහිස අල්ලා සෙලැවීය. 'අනේ, නැඟිටිනවා. නිදා ගන්නට බැරියැ ? මේ පෙට්ටිය තනියම ගෙන යන්නට බැහැ. නැඟිටලා පොඩියක් උදව් වෙනවා, හොඳ මිනිහා වාගේ.' මිනිහා විදුලිය මෙන් නැඟිට, 'හොරු, හොරු' යි මහ හඬ නඟා කිරිහාමිගේ බෙල්ල අල්ලා බිම ඔබා ගත්තේය. පිටත සිටි සොරු ගත් ගත් බඩුද ගෙන පැන දිවුවෝය. ගෙදර සෙසු මිනිස්සු අවුත් පහන් දල්වා කිරිහාමි වටා ගත්තෝය.

කිරිහාමි ගේ බෙල්ල වැලඳ ගෙන සිටියේ එසේ මෙසේ ඇඟිලි නොවේ. එහෙයින් හුස්ම ගැනීමද අමාරු විය. ඒ පිටට පහර හත අටක් දී හිස පිට ආදී තැන්වල සවිය බැලීය. හුස්මක් ලැබුණු

වහාම 'අනේ, මා මරන්නට එපා' යයි කිරි හාමි කෙඳිරි ගෑවේය. මරන්නට එපා ! එපා නම් මරුවා ළඟට ආවේ ?' මෙසේ කියමින් දැඩි මිනිහා කිරිහාමිගේ බෙල්ල අතහැර ඉල පිටට හොඳ පහරක් හෙළීය. කිරිහාමි දෙබඹයක් පමණ ඇත තිබුණු ඇඳෙක හැපී, අටුවෙන් හෙළූ වී මල්ලක් මෙන් බිම හොත්තේය.

'අනේ, මා අරන්නට එපා. මා හොරකමට ආවා නොවෙයි. හොරුන් මා ගෙට ඇතුළු කලා. බඩු ගෙන දෙන්නට කීවා. අර පෙට්ටිය තනියම ගෙනයන්න බැරි නිසයි මා ඔබට කථා කලේ. හොරකමට ආවා නම් කතා කරනවා යැ ? මා හිතුවා, හොරුන් මේ ගෙදර අයත් සමඟ කලින් දොඩා ගෙන බඩු ගෙන යනවා ය කියා.' කිරිහාමි මෙසේ කියත්ම සියල්ලෝ කොක් හඬලන්නට වූහ. වෙන හිරිහැරයක් නොකල හෙයින් කිරිහාමි කෙලින් වී බිම හිඳගෙන තමාගේ සියළු තොරතුරු කීයේය. ගෙදර මිනිස්සු ඔහුගේ සැටි තේරුම් ගෙන ඔහු එහිම නවතා ගත්හ.

කිරිහාමි නෑමට කැමතිය. එහෙත් එක විට හිසත් පයත් කිසි කලෙකත් නොතෙමයි. හිසෙහි සිට නාන්නට නම් දෙපය ගලක් උඩ තබා හිඳ ගනී, දෙපය තෙමා නාන විට හිසෙහි දිය බිඳක්වත් නොහෙළයි. දිනක් දෙපය උඩෙක තබා ගෙන නාන මොහු දුටු යහළුවෙක්, 'මේ කුමන විහිළුවක්දැ' යි කියමින් දෙපය අල්ලා දියෙහි එබීය. එදා කිරිහාමිට දියෙන් ගිනි නැඟුණේය. හේ වහා හිස අතගෑය. පය අත ගෑය. දෙපළම එක සැටි සීතලය. 'මා මළා, මා මළා' ය යි කියමින් හේ එතැනම හොත්තේය.

යහළුවා පළමුකොට මෙය විහිළුවකට ගත්තේය. එහෙත් කිරිහාමිගේ දෙපය එක්වුනු සැටි, දෑත එක්ව බඩමත සිටි සැටි, දෑස පියැවුණු සැටි, කට තදවුනු සැටි බලා මහත් භයට පැමිණියේය. 'අනේ, මා කළ මෝඩකම ! ඉතින් මෙයින් ගැලවෙන්නේ කෙසේද ? මෙතැනට මා ආ බව දෙතුන් දෙනෙකු දුටුවා. ඒ නිසා වහාම මෙතැනින්

දිවුවත් පලෙක් නෑ.'

මෙසේ සිතමින් ඉන්නා ඔහුට කදිම උපායයෙක් සිතුණේය. හේ කිරිහාමි අමාරුවෙන් ඔසවාගෙන කැලෑව මැදින් වහ වහා යන්නට වීය. බොහෝ දුර ගොස් පඳුරක් අස්සේ කිරිහාමි හොවා, මඳක් හති හැර පසු නොබලා ගෙදර දිවුවේය.

www.sinhalaelibrary.com

# 12. සවන පණ

එදා නම් කිරිහාමිට බොහෝ වේලා එහි ඉන්නට සිදු නොවීය. දර කඩන්න කැලෑවට ගිය තරුණියක් ඒ අසලට පැමිණියාය.

ඒ තරුණිය එහි දර කැඩුවාම නොවේ. සිතද පිනවා ගත්තාය. පිපුණු නා මලින් දරනුවක් කොට එය හිසෙහි ලා ගත්තාය. සපු මල් පෙති සිහින් වැලෙකින් අවුණා බෙල්ලෙහි ලා ගත්තාය. දර කඩමින් මිහි ගී ද කීවාය. ඇගේ ගී අසා කුරුල්ලෝ උගන්නට තැත් කළාහ; ගස් වැල්හු හිස් සලමින් තාලය විමැසූහ; මල්හු රොන් වගුරුවමින් තුරු පඩුරු දුන්හ.

මළ කිරිහාමි ගේ කනට නම් මඳ මඳ පණ ආයේය. 'කොපමණ මිහිරි කට හඬෙක්ද ? සැක නෑ. ඒ නම් ගෑනු කට හඬෙකි. මේ ගී කියන ගැහැනිය බලන්නට ඇත්නම් ! කිරිහාමි ගේ ඇසට ද මඳ මඳ පණ ආයේය. ඇස් ඒ අතට ඇදුණේය. 'අනේ, නොමැරුණා නම් ! මේ ළමයා උයන බත් මාළු බොහොම රස ඇති. මට බත් උයා දෙන්නට හොඳ, මෙහෙම කෙනෙක් තමා.' මෙසේ සිතෙන විට කිරිහාමි ගේ කටට පණ ආයේය. 'අනේ, තව සින්දුවක් කියන්න' යි ඔහුට නිකම්ම කියැවුණේය.

තරුණිය තිගැස්සුණාය. ඒ කවරෙක්දැ යි බැලුවාය; ළං වී බැලුවාය. හොඳ උස මහතින් හා පෙනීමෙන් යුත් කිරිහාමි දැක මඳක් බිම බලා, 'අනේ, නිදා ගන්නා තැනෙක හැටි' යි සෙමෙන් කීවාය.

'නිදා ගන්නවා ! මා නිදා ගන්නවා නොවෙයි.මේ මැරි-ලා'

'මැරි-ලා! දැන් මැරි-ලා බොහොම දවස් ද?'

'නෑ.දැන් මේ මැරුණා විතර යි.'

'හොඳයි,මැරි-ලා නම් දුවන්නේ නැත්තේ?'

'මැරුණු අය දිවුවා දැක්කා ද?'

'ඔව්,මා දැක්කා.අපේ මුත්තා මාස තුනකට ඉස්සර මළා.අවුරුදු දෙකකට ඉස්සර උන්දෑ පන්සලේ සිට අපේ ගෙදරටම දුවනවා මගේ මේ ඇස් දෙකින් දැක්කා.'

'ඒ නාකි මිනිස්සු.අපට නම් මළා ම දුවන්නට බැහැ.'

මෙයින් තරුණියට තරුණයා ගේ තරම වැටැහී ගියේ ය. මේ තරුණිය හොඳ තරුණයන් කීප දෙනෙකුටම පාවා දෙන්නට මවුපියන් සැරසුණ නමුත් කැමැති නුවූවාය.ඇයට රිසියෙන්නෙ තමාට අණ දෙන පිරිමියෙක් නො වේ;තමා ගේ අණ පිළිපදින පිරිමියෙකි.ඒ සඳහා මේ තරුණයා නම් හොඳ ම බව ඇයට පෙනුණේ ය.

'කොහිද ඔබේ ගම?'යි ඇයට නිකම්ම ම කියැවුණේ ය.

'කුමට අහනවා ද, මා මළාට පස්සේ?'

'ඉතින් මේ ගන්නට බැරි පණෙක් යැ?'

'අනේ පුළුවන්ද,පුළුවන්ද? පින්සිදු වන්නට මට පණ දුන්නොත් කියන අතකට හැරෙනවා.'

තරුණිය තොල් තද කර ගත්තා ය.

'එහෙනම් පන දෙන්ට ද ගන්ට ද?'

'පළමු කොට මට පන දෙන්න. ඊළගට මෙග් පන ඕනෑ නම් ගන්න.'

තරුණිය උත්සාහෙයන් සිනාව නවත්වා 'එහෙනම් හෙල්ලෙන්ට එපා' යයි කියා එක් අතකින් කිරිහාමිෙග් නාසය තද කර ගත්තා ය. අනෙක් අතින් කට තද කර ගත්තා ය. කිරිහාමි මද

වේලාවක් ඉවසා ගෙන සිටියේ ය. හුස්ම ගන්නට වෑයම් ක ළේ ය. දැත් දෙපය තුබුණු සේ ම තබා ගෙන ඇඹරුණේ ය.

එහෙත් තරුණිය තදින් ම නාසයත් කටත් අල්ලා උන්නී ය. අන්තිමේ දී කිරිහාමි තරුණියෙග් අත් දෙක ගසා දමා අහල තුබුණු දේත් ඇදෙන තරම් වේගෙයන් හුස්මක් ඇද 'පන ආවා' යයි කියා සිටියේ ය. තරුණිය සිනාසෙන්නට වූවා ය.

'හිනා! තවත් අල්ලා ගෙන හිටියා නම් ආ පණත් යනවා යනවා ම යි. හොඳයි කෙමක් නෑ. මේ කළ උපකාරයට මට කුමක් ද කරන්න කියන්නේ ?' යයි කිරිහාමි කී ය. 'යමු අපේ ගෙදර' යයි තරුණිය කීවා ය. කිරිහාමි කීකරු විය.

තරුණියෙග් මව්පියෝ කිරිහාමි දැක, 'මේ කවුදැ' යි ඇසූ හ. 'මේ මා එක්ක ආවා' යයි දුව කීවා ය. 'හා එහෙනම් දුව ඒ ළමයාට කැමති ද?' තරුණිය එකවර ම 'ඔව්' ය කීවා ය. දෙමව්පියෝ නෑදෑයනට ද කියා මගුල් කා, දුව කිරිහාමිට පාවා දුන්නෝ ය. එතැන් පටන් කිරිහාමි තමාගේ බිරින්දෑගේ අණට කීකරුව සැපසේ කල් ගත කෙරෙයි.

# 13. සවන මරණය

කිරිහාමි දැන් පියෙකි. ඔහුගේ කුඩා පුතාගේ වයස සාර මාසය. කුඹුරේ සිට සවස ගෙදර ගිය විට දරුවා හුරතල් කිරීම විනා කිරිහාමිට වෙන කටයුත්තෙක් නැත.

දිනක් කිරිහාමි තද අව්වේ ගොයම් කපමින් සිට, දෑකැත්ත නියර උඩ තබා බතට ගියේය. නැවත අවුත් දෑකැත්ත ගත් කල එය තමාගේ අත දවන තරම් උණු බව කිරිහාමිට දැනුණේය. 'අනේ, දෑකැත්තට උණ ගැනිලා. අද ඉතින් ගොයම් කපන්නේ කෙසේද ? මගේ පොඩි දෑකැත්ත සුව කැර ගන්නේ කෙසේද ?' මෙසේ සිතමින් කිරිහාමි දුක් වුණේය.

එවිටම ගමේ වෙදා ඒ අසලින් ගියේය. කිරිහාමි දිව ගොස්, දෑකැත්ත වෙදාට පෙන්වා, 'අනේ, වෙද හාමි, බලන්න, මගේ දෑකැත්තට උණ. මේකට ඉතින් කුමක්ද කරන්නේ ?' ය යි කීය. වෙදා කිරිහාමි ගැන හොඳින් දන්නෙකි. එහෙයින් දෑකැත්ත අල්ලා බලා, 'ඔව්, හොඳටම උණ. මේකට මම හොඳ වෙද කමක් කියන්නෙම්. මෙය අර ගඟට ගෙනගොස් දිය යට ඔබා ඉන්නවා.' කිරිහාමි දිව ගොස් එසේ කලේය. දියෙන් ගත් පසු කුමන පුදුමයෙක්ද ? දෑකැත්තට මඳක් වත් උණ නැත. වෙදාගේ හපන් කම ගැන පුදුම වෙමින් ගොස් කිරිහාමි ගොයම් කැපුවේය.

එදා සවස ගෙදර යනවිට කිරිහාමිගේ නැන්දාට හොඳටම උණය. ගෙදර අය වෙද ගෙදර යන්නට සැරසෙති. කිරිහාමි ඒ දැක, 'හා, වෙද ගෙදර යන්නට ඕනෑ නෑ. දැන් උණට හොඳ වෙදකමක් මා අසා ගත්තා. උණට ඒ වාගේ වෙද කමක් තවත් නෑ. ඔසවා

ගනිමු ලෙඩා.' කිරිහාමි මෙසේ කියා, තවත් කිහිප දෙනෙකුගේ උදවු ඇතිව, නැන්දා ඔසවා ගෙන ගඟ ලඟට ගියේය. එහිදී කිරිහාමිගේ මාමා මේ කුමක් කරන්නට යනවා දැයි ඇසීය. 'භයක් ගන්නට එපා. මගේ දැකැත්තට අද ගැණුන උණ කොපමණ තදද ? වෙද හාමි කී හැටියට මා එය ගඟේ ඔබාගෙන උන්නා. දියෙන් ගත්තාම කෝ උණ ? ඒ වෙදකම කරන්නටයි මේ යන්නේ.'

කිරි හාමි මෙසේ කී කල, මාමා කිපී ඔහු තල්ලු කැර දමා, ලෙඩා ගෙදර ගෙන ගියේය. කිරි හාමි මාමාගේ තල්ලුයෙන් ලී කොටයක් මෙන් ගඟේ වැටී, දිය යටට බැස්සේය. දියෙන් ගොඩ එනවාත් සමඟම ඔහුට මතක් වූයේ මැරෙන දවසයි. එක අතක් හිසටත්, එක අතක් පයටත් එක් වරම ඇදී ගියේය. ගඟේ වැටුනු මිනිහාගේ හිසත් පයත් සීතල නොවේද ? 'මා මළා, මා මළා' යි පුරුදු හඬ නඟාගෙන, කිරිහාමි ගං ඉවුර මත්තෙහි වැටුණේය. ලෙඩා ගෙනගිය අයට මේ හඬ ඇසී දිව ආ කල ඔවුන් දුටුවේ කිරිහාමිගේ මළ කඳය. ඔවුන්ගේ කෑකෝ හඬට කිරිහාමිගේ භාර්යාවද පැමිණියාය.

කිරිහාමිනෝ සිදු වූ දෙය දනී. එහෙත් ඇත්ත එළි කරන්නට බිය වූවාය. යම් ලෙසකින් ඇත්ත දැනගතහොත්, සියල්ලෝ ම ඇයටද ඇයගේ දරුවාටද කවටකම් කෙරෙති. එහෙයින් එයින් මිදෙන්නට සුදුසු උපායක් යෙදූවාය.

'මා මෙතැන සිටිනවා. ඒ ඇති. අම්මාට වෙද කම් කරවන්න. ගෙදර යන්න.' මෙසේ කියා කිරිහාමිනෝ තම සැමියා වටාගෙන සිටි සියල්ලන් ගෙදර යැවූවාය. ඉක්බිත් සැමියාට පමණක් ඇසෙන තරමට හැඬුවාය. 'අනේ, ඉතින් මටත් මගේ දරුවාටත් යන කල ! මා විතරක් ඉඳලා කුමක් කරන්නටද ? මාත් මෙතැනම මැරෙනවා !'

# 14. සත්වන පණ

තම බිරින්දෑ ගේ හැඬීම ඇසූ කිරිහාමිට බොහෝ හිත් වේදනාව ඇති විය. 'අනේ, නොමැරුණා නම් හොඳය' යි සිතුණේය. එහෙත් තමා මැරෙණ බවට නම් කිසි සැකයෙක් නැත. 'දිවැස් ඇති හාමුදුරුවන් හටත් වරදින්නට පුළුවන්ද ? මගේ හිසත් පයත් එක සැටිම සීතල වුණා නොවේද ? මා මළාම තමා.'

'මඛාම තමා' යි සිතූ නමුත් කිරිහාමි බිරින්දෑට අවවාද කළේය. 'අනේ, මා මළාට මැරෙන්නට හිතන්නට එපා. අප දෙන්නාම මැරුණාම දරුවාට යන කලෙක් නෑ. දරුවා රැක බලාගෙන ඉන්න. දරුවා දකින කල මා මතක් වේවි. අඬන්නට එපා. අඬාලා කුමක් කරන්නටද ? කුමක් කරන්නටද ? කොපමණ කල් සිටියත් මැරෙනවා නොවෙ යැ ?'

කිරිහාමි මෙසේ කියන කල කිරිහාමිනේ තව තවත් හැඬුවාය. 'මා මැරෙනවාමයි. මා ඉඳීමෙන් දැන් වැඩෙක් නෑ. මේ ගඟටම පනිනවා.' ඇය මෙසේ කියන්නා හාම කිරිහාමි තම මළ බව මතක් නොවී, දකුණතින් ඇයගේ අත අල්ලා ගත්තේය. වමතද දෙපයද තිබුණු සේ තබාගෙනම ඇය නවතන්නට උත්සාහ කළේය.

'ගඟට පනින්නට එපා. මා නොමැරුණා නම් ඔබට මැරෙන්නට දෙන්නේ නෑ. අර එදා වගේ මට පණ දෙන්නට බැරිද ?' කිරිහාමිනේට වුවමනා වුණෙත් ඒමය. එහෙයින් හැඬීම නවත්වා මෙසේ කීවාය.

www.sinhalalibrary.com

'පණ දෙන්නට පුළුවනි. හැබැයි රට පැලෙන්නට මර හඬ නොදෙනවා නම්'

'ඇයි, හඬ දුන්නොත් ?'

'හඬ දුන්නොත් මිනිසුන් ඒවි. මේ ගුරුකම දැන ගනීවි.'

'එහෙනම් එදා වාගේ මා මැරෙණ තරමට අල්ලන්නට එපා'

'හොඳයි, එහෙම නාල්ලා පණ නාවොත් ?'

'පණ ඒවි.'

'පණ ආවාම එහෙනම් කකුලක් හොල්ලන්න. හඬ දෙන්නට නම් එපා.'

කිරිහාමි හඬ නොදෙන්නට ගිවිසියේය. කිරිහාමිනේ ඔහුගේ නාසය හා කට, හුස්ම නොයන තරමට පමණක් අල්ලා ගත්තාය. අමාරු වූ කිරිහාමි කකුලක් හෙල්ලුවේය. කිරිහාමිනේ අත අහකට ගත්තාය. 'පණ ආවා' දැයි ඇසුවාය.

'ඔව්, ආවා, එදා වාගෙ අමාරු වුණේ නෑ.'

'ඒ නොදන්නා දවසේ එසේ කළාට දැන් රිදෙන්නට අල්ලනවා යැ?'

'අනේ ඉතින් දෙවරක්ම මැරිලා ඔබ නිසා උපන්නා. ඔබට ඕනෑ දෙයක් කියන්න'

'මේ වාගේ තවත් නොමැරෙනවා නම්, මට ඕනෑ එපමණයි'

'එය කරන්නේ කෙසේද ? එසේ වුණොත් දිවැස් ඇති හාමුදුරුවන්ගෙ කීම බොරු වෙනවා නොවෙ යෑ ?'

'හාමුදුරුවන්ගේ කීමට කුමක් වුනත් කමෙක් නෑ. මෙය මිනිසුන් දැනගත්තාම ලැජ්ජා නැද්ද ?'

කිරිහාමි හිස සෙලෙව්වේය. 'යමු යන්නට ගෙදර. මේ ගැන වඩ වඩා දොඩන්නේ කුමටද ? කරුමය අපට වළක්වන්නට බැහැ. හාමුදුරුවන්ගේ කීම කිසි කලෙක වරදින්නට බැහැ.' මෙසේ කියා කිරිහාමි දරුවා වඩාගෙන බිරින්දෑත් කැඳවාගෙන ගෙදර බලා පිටත් විය. කිරිහාමිනේ ලැජ්ජායෙන් බිම බලාගෙන ගියාය.

කිරිහාමිනේ ගෙදර යන නමුත් ඇය ගේ හිත යන්නේ වෙන අතකය. 'මේ මෝඩකම නැති කරන්නේ කෙසේද ? මෙය දැන්ම නැති නොකළොත් වන්නේ මහ නින්දාවයි. කල් නොයවා මා මීට යමක් කරන්නට ඕනෑ' මෙසේ සිතමින් ගෙදර ගොස්, 'කුමක් වුනාදැයි ? කුමක් වුණාදැයි අසාගෙන ආ අයට. නෑ ඒ නිකම් සිහි නැති වුණා' යි කියා, වෙනදා මෙන් කටයුතු කළාය.

# 15. නොමැරෙන යාගය

පසුදා උදයම කිරිහාමිනේ ගමේ යකැදුරාගේ ගෙදරට ගියේය. 'අපේ ගෙදරට අද එළිය ගෙනාවා දැ' යි යකැදුරා ඇසීය. 'ඔව් යකැදුරා හාමි, මා ආවේ බොහොම වැදගත් කටයුත්තකටයි. එය රහසින් කියන්නට ඕනෑ' යි කිරිහාමිනේ කීවාය.

යකැදුරා කිරිහාමිනේගේ වුවමනාව කියන්නට අවකාශ ගෙන දුන්නේය. තමාගේ රහස කිසිවෙකුට නොකියන ලෙස ගිවිස්වා ගෙන කිරිහාමිනේ සැමියාගේ තොරතුරු සියල්ල කීවාය. 'මහ නින්දාව නොවෙ යැ ? මිනිසුන් දැනගත්තොත් මටත් මගේ දරුවාටත් රටේ හිටින්නට ලැබෙන්නේ නෑ. අනේ යකැදුරා හාමි, මීට සුදුසු උපායයක් යොදන්න. ඒ ගැන හොඳටම සලකනවා.'

කිරිහාමිනේගේ වචනය අසා යකැදුරා මඳක් සිතිවිල්ලේ උන්නේය. 'හොඳා මා ඊට ගුරුකමක් කරනවා. දුක් වන්නට කමෙක් නෑ. අපි කිරිහාමිට යාගයක් කරමු. ඔහුට දැන් ගොහින් කියනවා මේ යාගය කලාට පස්සෙ නම් හිසත් පයත් කොපමණ සීතල වුනත් මැරෙන්නේ නෑ' කියා. වුවමනා දේ දන්නවා නොවෙයැ. කෙහෙල් කඳක්, ගොප් අත්තක්, මල් ටිකක්, තවත් යාගයකට ගන්නා දේ. හැබැයි හයියෙන් ආවඩන්න ඕනෑ'

කිරිහාමිනේ සිනා සෙමින් ගෙදර බලා පිටත් වුණාය. ගෙදර ගොස් කිරිහාමිගේ බඩ පුරවා සතුටු කොට යාගය ගැනද මතක් කලාය. 'ඉතින් බය නැතුව ඉන්නවා. අපේ යකැදුරා හාමි කීවා, යාගයක් කරන්නට එනවා ය කියා.

කාටද යාගය ? කුමකටද ?

යාගය ඔබට, හිසත් පයත් සීතල වුණු දා මැරෙනවාට.

ඉතින් යාගය කලාම කුමක් වෙනවාද ?

කොපමණ සීතල වුනත් මැරෙන්නේ නෑ.

කිරිහාමි සතුටින් උඩ පැන්නේය. බිරින්දෑ වටා බිම පෙරළුණේය. දරුවා වඩා ගෙන හිස පටන් දෙපතුල දක්වා සිඹ, 'ඉතින් බය වන්නට එපා, පුතා' යි කීයේය. තවද යාගයේ තොරතුරු ඇසීය.

අදද යාගය ?

නෑ හෙට. හෙට බදාදා නොවේද ? ඔව් හෙට හෙට

ඉතින් කුමක්ද ? මට කරන්නට කියන්නේ ?

'කෙහෙල් කඳක්, ගොප් අත්තක්, මල් ටිකක්, තවත් වුවමනා දේ සපයා තිබෙනවා. හැබැයි, අදට යන්තම් හිසත් පයත් සීතල නොකැරගෙන ඉන්නවා'

පසුදා යකැදුරා අවුත් මල් බලියක් තනා මුල්ලෙක තැබීය. රෑ බත් කා යාගය පටන් ගත්තේය. කිරිහාමි එක් සුදු කඩක් හැඳ ගෙන, එක් සුදු කඩක් පොරවාගෙන අලුත් පැදුරෙක හිඳ ගත්තේය. කිරිහාමිනේ දරුවාද වඩාගෙන පසෙකින් උන්නාය. නෑදෑයෝ

www.sinhalaelibrary.com

කීප දෙනෙක්ද බලා හුන්හ. එකෙක් අඟුරු දුම්මල අල්ලයි. එකෙක් විලක්කු තෙල් පොවා දල්වයි. හැඩිදැඩි කොල්ලෝ දෙන්නෙක් කන් බිහිරි වන තරම් හයියෙන් ආ වඩත්. යකැදුරා යදී, කවි කියයි, නටයි, මතුරයි, දුම්මල අල්ලයි. බලා ඉන්නෝ බුලත් කති. කිරිහාමි මහත් ඇදැහිල්ලෙන් ඇස් දල්වාගෙන, කට අයාගෙන හිඳගත් වනම හිඳී.

කුකුළන් හඬ ලද්දී යකැදුරා තදින්ම නටා, අඩි බිම හප්පා, කරකැවී, වැටී, බෙරයට රවා, යකුන් බය ගන්වා, ආතුරයා දෙසට හැරුණේය. වියත් එක හමාරක් පමණ ගිනි දළුවක් විහිදුවන විලක්කුව කිරිහාමිගේ මුහුණට හොඳටම ලං කළේය. 'හිසත් පයත් පමණක් නොවෙයි මූණ පපුව බස පිට යනාදී මෙකී නොකී කොතැන කොපමණ සීතල වුණත් තවත් මැරෙනවාද ?' මෙසේ මහ හෙණ හඬින් ඇසීය. හොඳටම බියවූ කිරිහාමි ගේ කටින්, නිකම්ම 'නෑ' යි කියැවුණේය.

මැරෙනවාද ?

නෑ

මැරෙනවාද ?

නෑ

මෙසේ තුන් වරක් ගිවිස්වා පස්වා දහසකට ආවඩා, ආයු බොහෝ වේවා, ආයු බොහෝ වේවා, ආයු බොහෝ වේවා' යි කියා යකැදුරා අසල තිබුණු දිය පිරූ කොරහ කිරි හාමිගේ හිසට නැමුවේය. කිරිහාමිගේ සර්වාංගය සීතල විය. එහෙත් හේ අතක් නිසෙල්වීය. පයක් නොනැවටීය. හඬක් නොනැඟීය. එදා හේ නොමළේය. යාගය සඵල විය.

කිරිහාමිනෝ ගේ සතුටේ කෙළවරෙක්
නැත. උදය කිරි බතින් සංග්‍රහ කොට, ඕ බුලත් කොළයෙක එතූ යම් කිසිවක් ඇදුරා අත තැබුවාය. ඇදුරා දත් මදක් දක්වමින් එය ඔඩොක්කුවේ ලා ගෙන පිටත් වූයේය. කිරි හාමි ගේ අපල දුරු වූයෙන් ඉන් පසු හිසත් පයත් සීතල වීම මරණයට හේතු නොවීය.

www.sinhalaelibrary.com

හත්පණ ර් පොත සෑදීම සඳහා උදව් දුන් අය.....

සචින් විදුරංග

කසුන් හර්ෂණ පීරිස්

**Rayan Claggy Karunarathne**

**Pasan Kanishka Nissanka**

**Roshan Eranga Jayarathna (ŜĿ ĐäřĶ PřīņćĚ)**

**Malith Kushan (පික්සු මලියා)**

**Rangana Weerakoon**

www.sinhalaelibrary.com